**ඩබ්ලිව්.ඒ. ධම්මික ප්‍රනාන්දු එ. මහජන බැංකුව**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1193 /2019 (2019.08.06 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඩබ්ලිව්.ඒ. ධම්මික ප්‍රනාන්දු
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, මහජන බැංකුව

**පෙනීසිටීම**

අභියාචක - ඩබ්ලිව්.ඒ. ධම්මික ප්‍රනාන්දු
නීතිඥ චතුර වර්ණසූරිය
නීතිඥ පසිඳු සිල්වා
පොදු අධිකාරිය - නීතිඥ යූ.එම්.ජේ. ඉන්ද්‍රජිත්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.05 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.10.26 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.05 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.11.08, 2018.11.26 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.01.14 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.10.05 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

2017.01.02 දින 7860/2017 දරන චක්‍රලේඛ ලිපිය මඟින් සේවක චක්‍ර ලේඛ 300/99 සහ 300/99(1) ට අදාළව කැඳවූ මහජන බැංකුවේ ප්‍රධාන බැංකු ධාරාවේ කළමණාකාර (3-1) ශ්‍රේණියට උසස් කිරීමට අදාළව අභියාචක විසින් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් යොමු කරන ලදී. ඒ අනුව අභියාචක ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් 2018.03.18 දින පවත්වන ලද ලිඛිත තරග විභාගයකටද පෙනී සිටි අතර ,එහි ප්‍රතිපල මත හා අභියාචකහට පිරිනමන ලද සේවා ලකුණු, වෘත්තිය හා අධ්‍යාපනික සුදුසුකම්වලට ලබා දෙන ලද ලකුණු මත සම්මුඛ පරීක්ෂණයක් සඳහා අභියාචක කැඳවන ලදී. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසු විවිධ අපේක්ෂකයන්හට උසස්වීම් ලිපි ලැබී ඇති බව දැනගැනීමට ලැබුණු අතර අභියාචකහට එම උසස්වීම් ලිපි නොලැබුණි.

කළමණාකාර (3-1) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා උසස්වීම් ලැබූ අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුව මෙතෙක් මහජන බැංකුව මඟින් ප්‍රසිද්ධියට පත් කර නැත. එසේම, උසසස්වීම් ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය අවසන් දැයි නිශ්චිතව පැහැදිලි නැත. මෙම උසස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු දන ගැනීමේ පනතට අදාලව පහත තොරතුරු ඉල්ලා සිටි.

1. මෙම උසස් කිරීමේ ක්‍රියාවලියට අදාළව උසස්වීම් ලැබූ අපේක්ෂකයන් සඳහා උසස්වීම් ලිපි නිකුත් කර අවසන්ද ?යන්න
2. මෙම උසස් කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් එවන ලද අපේක්ෂකයන්ගේ ප්‍රමාණය
3. ලිඛිත තරග විභාගය සඳහා පෙනී සිටි අයදුම්කරුවන්ගේ ප්‍රමාණය
4. ලිඛිත තරග විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගෙන් එම විභාගයේ කොන්දේසි වලට අනුකූලව සමත් වූ ප්‍රමාණය
5. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් බැංකුව වෙත නිකුත් කරන ලද අදාළ විභාග අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විභාග ලැයිස්තුව.(පළමු ප්‍රශ්න පත්‍රය, දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණු සඳහන් වන පරිදි සහ සමත්/අසමත් භාවය සහිතව)
6. 3-1 කළමණාකාර ශ්‍රේණියේ උසස්වීම් සඳහා අයදුම් කළ සියලුම අයදුම්කරුවන්ගේ-
   a) සේවා ලකුණු ලැයිස්තුව
   b) අධ්‍යාපන සුදුසුකම් ලකුණු ලැයිස්තුව
   c) වෘත්තිය සුදුසුකම් ලකුණු ලැයිස්තුව
7. සම්මුඛ පරීක්ෂණයට පෙර ඒ ඒ අපේක්ෂකයන් ලබා සිටි මුළු ලකුණු ප්‍රමාණය සඳහන් ලැයිස්තුව
8. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අවම ලකුණු සහ එය තීරණය කළ පදනම
9. සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් කොපමණ ප්‍රමාණයක් සහභාගී වීද යන්න
10. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දෙන නිර්ණායක සහ එම නිර්ණායක සඳහා ලකුණු වෙන් වන අන්දම
11. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන එක් එක් අපේක්ෂකයන් වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී අවසාන ලකුණ ගණනය කරන ආකාරය
12. (i) සම්මුඛ පරීක්ෂණයේදී අභියාචකයන් ලැබූ ලකුණු
    (ii) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද සියලුම අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දුන් ලකුණු ලැයිස්තුව
    (iii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් සම්මුඛ පරීක්ෂණය අවසානයේදී සිය අත්සන් සහිතව ලබා දුන් ලකුණු ලයිස්තුවේ මුල් පිටපතේ අනු පිටපතක්
13. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ අයගේ ලිඛිත පරීක්ෂණ ලකුණු, සේවා ලකුණු, වෘත්තීය සුදුසුකම්වල ලකුණු, අධ්‍යාපන සුදුසුකම්වල ලකුණු සහ සම්මුඛ පරීක්ෂණ ලකුණුවල එකතුව සඳහන් අවසාන ලකුණු ලැයිස්තුව
14. උසස්වීම් ලිපි නිකුත් කළ කඩඉම් ලකුණ
15. මෙම උසස්වීම් ක්‍රියාවලියේදී උසස්වීම් ලිපි නිකුත් කරන ලද අපේක්ෂකයන්ගේ නාම ලේඛණය

*(ඉහත 5,6, (a,b,c) යන විමසුම් එක වගුවකත් 7,12 (ii) ,13 යන විමසුම් තවත් වගුවකත් දැක්වීම ප්‍රමාණවත් වේ.)*

තොරතුරු නිලධාරියා 2018.10.26 දිනැතිව පහත පරිදි තොරතුරු ලබාදෙන ලදි.

1. උසස්වීම් සඳහා තෝරා ගනු ලැබූ සියලු දෙන වෙත උසස්වීම් ලිපි නිකුත් කර අවසන් වී ඇත. එසේ වුවද උසස්වීම් සඳහා සුදුසුකම් ලැබුවද, සේවක චක්‍රලේඛ 300/99 සහ එහි පරිෂ්ධයන්හි සඳහන් පරිදි නොනිමි විනය පරීක්ෂණ පවතින සේවකයන්ගේ උසස්වීම් සඳහා සුදුසුකම් නොලබන පරිදි විනය පියවරයන්ට පාත්‍ර වූ සේවකයන් සඳහා උසස්වීම් ලිපි නිකුත් නොකරේ.
2. අපේක්ෂකයන් 1270ක් විසින් උක්ත ශ්‍රේණියට උසස්කිරිම සඳහා අයදුම්පත් එවන ලදී.
3. අයදුම්කරුවන් 625 දෙනෙකු 2018.03.18 දින පවත්වන ලද ලිඛිත තරග විභාගයට පෙනී සිට ඇත.
4. අයදුම්කරුවන් අතරින් 560 දෙනෙකු විභාගය සමත් වී ඇත.
5. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) සහ (උ) උපවගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
6. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) සහ (උ) උප වගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
7. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) සහ (උ) උපවගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
8. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ අවම ලකුණ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ සේවකයන් ලබා ගත් ලකුණු මත තීරණය කර ඇත.
9. අපේක්ෂකයන් 274 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබිය.
10. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් සඳහා ලබා දෙන ලකුණු පහත පරිදි වේ.

| Acceptance of Additional Responsibility | Personality | Special Claims | Performance | Social Skills | Total Marks |
|---|---|---|---|---|---|
| 06 | 01 | 01 | 01 | 01 | 10 |

11. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් 5 දෙනාගේ ලකුණුවල සාමාන්‍ය අවසාන ලකුණ සේ ගැනේ.
12.
    I. තම තමන්ගේ පුද්ගලික ලකුණු අවශ්‍ය නම් පැහැදිලි අත්සනද සමග අදාළ ඉල්ලීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන මෙන් දන්වමු.
    II. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) හා (උ) උපවගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
    III. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) සහ ( උ) උපවගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
13. උසස්වීම් ලිපි නිකුත් කළ කඩඉම් ලකුණ ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය සහ පවත්නා පුරප්පාඩු ප්‍රමාණය සැලකිල්ලට ගෙන තීරණය කර ඇත.
14. උක්ත පනතෙහි 5 වගන්තියෙහි (අ) සහ (උ) උප වගන්ති යටතට අයත්වන බැවින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරමු.
15. උසස්වීම් ලිපි නිකුත් කළ කඩඉම් ලකුණ ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය සහ පවත්නා පුරප්පාඩු ප්‍රමාණය සැලකිල්ලට ගෙන තීරණය කර ඇත.

මින් අතෘප්තියට පත් අභියාචක 2018.11.05 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. 2018.11.26 දිනැතිව නම්කළ නිලධාරියා සඳහන් කර ඇත්තේ ලබා නොදී ඇති තොරතුරු ලබාදීමට පනතේ 5(අ), (ඌ) හා අනෙකුත් අදාළ උපවගන්ති මත ලබා දීමට නොහැකි බවයි. මෙයින්ද අතෘප්තියට පත් අභියාචක විසින් 2019.01.14 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

අභියාචක විසින් විමසා ඇති අයිතමයන්ගෙන් අයිතම අංක 5,6,7,12,13 හා 15 යන අයිතමයන් හැරුණු කොට තොරතුරු ලබාදී ඇතත් තොරතුරු ලබාදුන් අයිතම අංක 8 හා 14ට අදාළ වන තොරතුරු නිසියාකාරව ලබාදී නොමැති බව අභියාචක කියා සිටී.

ඒ අනුව අයිතම අංක 8ට අදාළව එම තොරතුරු වන 'සම්මුඛ පරීක්ෂණය කැඳවීම් කළ අවම ලකුණු සහ එය තීරණය කළ පදනම නිශ්චිතව ලබාදිය යුතු බවටත් අයිතම අංක 14ට අදාළව එම තොරතුරු වන 'උසස්වීම් ලිපි නිකුත්කළ කඩඉම් ලකුණ' යන්න පොදු තොරතුරක් වන බැවින් එය පෞද්ගලිකත්වය හෝ විශ්වසනීය සබඳතාවට හානියක් නොවන බවත් ඒ අනුව ඊට නිශ්චිත වශයෙන් පිළිතුරක් ලබාදිය හැකි බවටත් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

**මෙහිදී පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටියේ තම පාර්ශ්වයෙන් ලිඛිත කරුණු දැක්වීම් සඳහා නැවත දිනයක් ලබා දෙන ලෙසයි.**

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරියට අදාළ ලිඛිත කරුණු දැක්වීමට අවසර ලබා දෙමින් මීළඟ අභියාචනා විභාගය 2019.09.10 වන දින ප.ව. 3.45ට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*****